# පුරප්පාඩු පිරවීම

## ජාතික මෝස්තර මධ්‍යස්ථානය

ජාතික මෝස්තර මධ්‍යස්ථානය බතික්, අත්යන්ත්‍ර රෙදිපිළි හා දේශීය ඇඟළුම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ස්ථාපිත රාජ්‍ය සංස්ථාවකි. මෙම ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා පැවරුම් පදනම මත අයදුම්පත් කැඳවනු ලැබේ.

### තනතුර : සභා ලේකම්

(පාලක මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධ රාජකාරිවලට අමතරව සභාපතිවරයාගේ පෞද්ගලික සහකාර තනතුරේ කාර්යයන්ද ඉටුකළ යුතුය)

**අධ්‍යාපන සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ක්ෂේත්‍රයට අදාළ උපාධියක් හෝ පිළිගත් ආයතනයකින් ලබාගත් ලේකම්කරණය පිළිබඳ ඩිප්ලෝමාවක් / උසස් ඩිප්ලෝමා පාඨමාලාවක්.

**පළපුරුද්ද :** ක්ෂේත්‍රයට අදාළව වසර 05 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය. සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් කටයුතු කිරීමේ මනා හැකියාව තිබිය යුතු අතර, කාර්යාල පරිගණක භාවිතය (සිංහල / ඉංග්‍රීසි) පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

**මාසික දීමනාව :** රු. 30,000.00

**වයස :** අවු. 30 නොඅඩු හා අවු. 55 නොවැඩි විය යුතුය.

### තනතුර : තොරතුරු තාක්ෂණ නිලධාරී

**අධ්‍යාපන සුදුසුකම් :** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත විශ්වවිද්‍යාලයකින් ලබාගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක්.

**පළපුරුද්ද :** ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර 01 ක පළපුරුද්ද තිබිය යුතුය, ඉංග්‍රීසි හා සිංහල භාෂාව හැසිරවීමේ මනා හැකියාවක් තිබීම.

**මාසික දීමනාව :** රු. 30,000.00

**වයස :** අවු. 22 නොඅඩු හා අවු. 55 නොවැඩි විය යුතුය.

**සටහන :** සම්මුඛ පරීක්ෂණයේදී ඉටුකළ යුතු කාර්යයන් පිළිබඳ පැහැදිලි කරනු ලැබේ.

ඉහත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් විසින් අධ්‍යාපන, වෘත්තීය සහ පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල ඡායා පිටපත් සමග 2020.10.29 දිනට පෙර **සභාපති, ජාතික මෝස්තර මධ්‍යස්ථානය, නො. 10, ද මෙල් පාර, කටුබැද්ද, මොරටුව** ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

අදාළ සහතිකවල ඡායා පිටපත් නොමැති අයදුම්පත් භාරගනු නොලැබේ.

**සභාපති, ජාතික මෝස්තර මධ්‍යස්ථානය, නො. 10, ද මෙල් පාර, කටුබැද්ද, මොරටුව.**

Source: Dinamina, Daily News (2020.10.16)